දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla.**

මගේ අංකය
எனது இல.
My No. } PSC/EST/03-01-19/02/2017

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2019 ජුනි මස 26 දින

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 02/2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>නීති නිලධාරී තනතුර සඳහා වන අනුමත බඳවා ගැනීම් පටිපාටිවල බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීම.</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.06.04 දින දක්වා අනුමත කරන ලද නීති නිලධාරී තනතුර සඳහා වන සියළුම බඳවා ගැනීමේ පටිපාටිවල 7.2.2.1, 7.2.2.2 සහ 7.2.4.4 කොටස් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව 2019.06.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

| අනු අංකය | විෂය | වෙනස් විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 7.2.2.1 | අධ්‍යාපන සුදුසුකම් -<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම. |
| 2. | 7.2.2.2 | පළපුරුද්ද<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන් වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.<br>(i) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.<br>(ii) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු<br>(iii) අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු |

| | | |
|---|---|---|
| | | (iv) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු<br>(v) විවිධ ව්‍යවස්ථාපිත ආයතන වලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු |
| 3. | 7.2.4.4 | යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය |

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාල නොවේ |
| 2. අතිරේක වෘත්තීය පළපුරුද්ද | 35 | |
| 3. භාෂා හැකියාව | 15 | |
| 4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය<br>(සාමාන්‍ය දැනීම හා බුද්ධිය - 05<br>නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම - 05<br>පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය - 05) | 15 | |
| එකතුව | 100 | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව